මගේ අංකය :JSC/SPO/EB/2020 (2025)

සියලුම,
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්/මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්/ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලිපිකරු I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020**

අංක 2088/26 හා 2018 සැප්තැම්බර් මස 11 දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උපලේඛනගත රජයේ නිලධාරීන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 10.10 වගන්තිය සහ "ඒ" පරිශිෂ්ඨයෙහි 01.1 හි දැක්වෙන කොන්දේසි හා විෂය නිර්දේශය අනුව අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලිපිකරු I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් කොළඹ දී පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- ❖ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලිපිකරු I වන ශ්‍රේණියට 2020.12.31 දිනට පෙර උසස්වීම් ලද නිලධාරීන් පමණක් මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

- ❖ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලිපිකරු I වන ශ්‍රේණියේ නිලධාරීන් එම ශ්‍රේණියට උසස්වීම ලබා වසර 05 ක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

02. විභාගය පිළිබඳ විස්තරය

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු | සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම. |
|---|---|---|---|---|---|
| 01 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සහ නීති ක්‍රම | පැය 02 | 100 | 40 | ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වීම හෝ නීතිවේදී උපාධිය හෝ නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 02 | කාර්යාල කළමනාකරණය | පැය 02 | 100 | 40 | - |
| 03 | ඉංග්‍රීසි | පැය 02 | 100 | 40 | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. |

03. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය සහ නීති ක්‍රම | ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීම හා ශ්‍රී ලංකාවේ දැනට පවත්නා නීති ක්‍රම හා අධිකරණවල බලතල පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීම. |
| 02 | කාර්යාල කළමනාකරණය | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි, කාර්යාල ක්‍රම හා කාර්යාල සංවිධානය පිළිබඳ අවබෝධය මැනීම. |
| 03 | ඉංග්‍රීසි | අ.පො.ස. (සා.පෙළ) ප්‍රශ්න පත්‍රයට සමාන අයුරින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරෙනු ඇත. |

04. මෙම ප්‍රශ්න පත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න, රචනා ප්‍රශ්න හා/හෝ ප්‍රායෝගික ප්‍රශ්න වලින් සමන්විත වනු ඇත.

05. අධිකරණ ලිපිකරු සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් නිලධාරීන් විසින් ' ඉංග්‍රීසි ' විෂය හැර අනිකුත් විෂයන්හි ලිඛිත ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සැපයිය යුතුය.

06. පහත 07 ඡේදයේ සඳහන් කොන්දේසි වලට යටත්ව තමන් කැමති වන්නේ නම්, එක් එක් විෂය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාර වල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිය. එතකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂය සඳහා අවම වශයෙන් සියයට හතළිහක් (40%) නිලධාරීන් විසින් ලබා ගත යුතු වේ.

07. මෙම විභාගයට ප්‍රථම වරට ඉල්ලුම්කරන අයදුම්කරුවන් විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එකවරකදී සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් හෝ එක් විෂයයකට වඩා පෙනී සිටින්නේ නම් රු. 500/- ක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු 250/- ක් ද විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. මීට ප්‍රථම මෙම විභාගය සඳහා ඉල්ලුම්කර ඉදිරිපත් නොවූ නිලධාරීන් දෙවන වතාවට ඉදිරිපත් වන සේ සලකා විභාග ගාස්තු ගෙවා විභාගයට අයදුම්කල යුතුය. කවර කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

08. මෙම විභාග ගාස්තු **අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්** නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක **297100199025039** ට බැර කර ලබා ගන්නා ලදු පත අයදුම්පත්‍රයෙන් වෙන් කර ගැනීමට හැකි වන පරිදි අමුණා එවිය යුතුවේ.

09. මේ සමඟ ඇති ආකෘති පත්‍රයට අනුව 11 ½ " X 8 ½ " ප්‍රමාණයේ ඝන කඩදාසියේ සකස් කොට සම්පූර්ණ කරන ලද අදාල නිලධාරීන්ගේ අයදුම්පත්‍ර ඔබේ නිර්දේශය සමග **2025 සැප්තැම්බර් මස 30** වන දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මෙම කාර්යාලයට එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලිපිකරු I ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 "** යනුවෙන් සඳහන් කළ යුතුය.

10. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා නිසි අයුරින් සම්පූර්ණ නොකළ අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. මෙම ලිපිය ඔබ අධිකරණයේ අදාල සියලුම නිලධාරීන්ට දැන්වීමට කටයුතු කරන්න.

උද්දාල සුවන්දුරුගොඩ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

උද්දාල සුවන්දුරුගොඩ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

අත්/කලේ: ප්‍රසන්න අල්විස්
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2025 සැප්තැම්බර් මස 03 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

## SPECIMEN APPLICATION FORM
## Efficiency Bar Examination for Officers in Court Clerk Grade I of the Court Management Assistants' Service – 2020

01. Name:
    1:1 Name with initials Mr./Mrs./Miss: ......................................................................................
    (In block capital letters)
    1:2 Full Name: ..........................................................................................................
    (In block capital letters)
    1:3 Full Name: ..........................................................................................................
    (In Sinhala/Tamil)

02. National Identity Card Number: ...............................................................................

03. Address:

    3:1 Permanent address: ...........................................................................................
    (In block capital letters)
    3:2 Official address: ................................................................................................
    (In block capital letters)

04. Contact Details
    4.1 Mobile No-: ..............................................

05. Date of Birth: Date ___ Month ___ Year______

06. Personal File No: EA/PF/1/........

07. Date of promotion to the post of Court Clerk Grade I: .......................

08. The medium in which you sit for the examination:

☐

(Denote with "S" for Sinhala, "T" for Tamil)
Note : Candidates should select the relevant question paper according to his/her appointment.

09. Please give details of subjects and years you sat for the exam previously:

| Year | Subject |
|---|---|
| | I.<br>II.<br>III. |
| | I.<br>II.<br>III. |

10. Subject / Subjects you are now offering to sit for:

(i) ............................................

(ii) ....................................

(iii) ..................................

11. (i) The value of payment made as Examination fee: ......................................

(ii) Name of the Bank and the Branch to which the payment was made: .................

(iii) Number and date of the receipt: ..............................................................

| Affix the receipt here. |
|---|

I state that the particulars given are accurate and I am entitled to sit for the Examination in the medium mentioned in the paragraph 8 above. I certify that I am appearing for the Examination for the first time / I have annexed the receipt obtained after making the appropriate payment. I agree to be bound by the rules and regulations of the Secretary to Judicial Service Commission regarding conducting of the examination.

................................ ........................................

Date Signature of the Applicant

Note: Applicant should sign before the Head of the Department/ Registrar of the relevant court.

---

**Attestation**

I hereby certify that Mr./Mrs./Miss........................................................................................................ who is a Grade I Court Clerk is personally known to me and signed before me on ............................................

......................................

Signature of the Registrar

Date: ......................................

Name: ....................................

Designation: ............................

Address: ..................................

---

**Certificate of the Head of the Department**

I certify that,

01. The particulars furnished above were checked and found to be accurate.

02. The officer sits for this Examination for the first time/ has made the correct payment as Examination Fee.

03. The applicant is eligible to sit for this Examination.

Designation: ..........................

Date: ......................................

.....................................

Signature of the Head of the Department